4th International Conference of Multidisciplinary Approaches (iCMA), 2017
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka
ISSN: 2386 – 1509
Copyright © iCMA


# *සිනමා විචාරයෙහිලා සිරිල් බී. පෙරේරාගේ දායකත්වය*

**හේමින්ද බස්නායක බී. ඒ. එන්.**
**කනිෂ්ඨ අධිශිෂ්‍යත්වලාභී, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**
*nipunaheminda90@gmail.com*

සිරිල් බී. පෙරේරා යනු ක්ෂේත්‍ර ගණනාවක සුවිශේෂ ශක්‍යතාවන් පෙන්නුම් කළ කලාකරුවෙකි. නවකතා, කෙටිකතා, කාව්‍ය, පුවත්පත් ලිපි ආදිය ලිවීමෙන් ඔහු පළ කළ කුසලතාව විද්‍යමාන වෙයි. සිරිල් බී. පෙරේරාගේ සාහිත්‍ය කලා දායකත්වය සිනමා මාධ්‍යය කෙරෙහි වැඩි වශයෙන් උපයෝගී වී තිබෙන බව ප්‍රකට කරුණකි. සිනමා අංශයෙහි ද ඔහුගේ දායකත්වය බහුවිධ මානයන් ඔස්සේ විහිද ගොස් තිබේ. සිනමා ගීත රචනය, තිර පිටපත් රචනය, සිනමාව පිළිබඳ ඉගැන්වීම කටයුතු කිරීම ඒ අතුරෙන් කිහිපයකි. එමතු නොව ඔහු ප්‍රබල සිනමා විචාරකයෙකු ද වෙයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සිනමා විචාරය අරඹයා සිරිල් බී. පෙරේරා දක්වා ඇති දායකත්වය පිළිබඳ විමසා බැලීම යි. ඔහු සිනමා විචාරයෙහිලා කුමන අංශ කෙරෙහි අවධානය යොමු කොට තිබේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි. මෙම පර්යේෂණ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා මූලාශ්‍රය වශයෙන් පෙරේරා විසින් ලියන ලද විචාර හා බැඳුණු සිනමා කෘති යොදා ගැනිණ. ඔහුගේ විචාර සහිත පුවත්පත් ලිපි සහ විචාර කෘති ද මෙහිලා මූලාශ්‍රය විය. මීට අමතරව අන්තර්ජාලය ආදිය ද පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් උපයෝගී වූ අතර වෛෂයික ප්‍රාමාණිකයන් සමග කළ සාකච්ඡා ද මෙහි ලා ඉවහල් විය. ඒ අනුව ඔහු නවසිය හැටේ දශකයෙහි ඉදිරිපත් කොට ඇති විචාර කලාව යුගය සමතික්‍රමණය කළ ඒවා බැව් සිතිය හැකි ය. විශේෂයෙන් 'පරසතු මල්' වැනි සිනමා කෘතියකට ඔහු ඉදිරිපත් කරන විචාරය අතිශය මනෝ විශ්ලේෂණවාදී ය. මනෝ විශ්ලේෂණවාදී සිනමා විචාර කලාවක ආරම්භක අවස්ථාව වශයෙන් මෙය ගිණිය හැකි ය. මීට අමතරව ඔහු සිනමා විචාරයෙහිලා සාහිත්‍යාත්මක පක්ෂය කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කර ඇති බව පෙනේ. තාක්ෂණික හා ශිල්පීය ක්‍රමවේද භාවිතය මෙන් ම සිනමා සෞන්දර්ය කෙරෙහි ද ඔහු දක්වන අවධානය තීව්‍ර ය. මෙලෙස බලන විට සිරිල් බී. පෙරේරා යනු ලාංකේය සිනමා මානයට නවමානයක් එක් කළ එමෙන් ම සිනමාවේ බහුවිධ අංශ කෙරෙහි අවධානය යොමු කළ විචාරකයෙකු බව සඳහන් කළ හැකි ය.

ප්‍රමුඛ පද : විචාරය, දායකත්වය, තිරරචනය, සෞන්දර්ය, නවමානය